## දැව හෙලීම බලපත්‍ර ලබා ගැනීම සඳහා ලියවිලි සමග අයදුම්පත ඉදිරිපත් කරන්න

01. දැව හෙලීමට අදාල ඉල්ලීම් ලිපිය

02. ග්‍රාමනිළධාරී වාර්තාව (කැපුම් අවසර සඳහා ඉල්ලුම්කරුට දැව පිහිටි ඉඩමට ඇති අයිතිය තහවුරු කර තිබිම,දැව ප්‍රවාහනය කරන්නේද නොකරන්නේද යන්න පැහැදිලිව සඳහන් කර තිබීම)

03. ග්‍රාම නිලධාරීන් විසින් සහතික කරන ලද දැව කපන ඉඩමේ නිරවුල් ඔප්පු පිටපත

04.ග්‍රාම නිලධාරීන් විසින් සහතික කරන ලද ඔප්පුවට අදාල පිඹුරු පිටපත (ඔප්පුවේ හා පිඹුරේ සතර මායිම් ,ප්‍රමාණයන් ආදීය ගැලපිය යුතුය) (ජයභූමි ඉඩමක් නම් ජාලගත මිනුමක් ඉදිරිපත් කරන්න)

05.ඔප්පුවට අදාල පත් ඉරුව අවසාන පිටුව දක්වාම බදුල්ල ඉඩම් රේජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගෙන ඉදිරිපත් කරන්න

(අයදුම්පත ඉදිරිපත් කරන දිනට පත් ඉරුව ලබාගෙන මාස 06 ඉක්මවා තිබු පත් ඉරුව භාර නොගනී)

06. ඉල්ලුම් කරන්නේ භාර කරු නොවේ නම් ඉඩම අයිතිකරුගේ කැමැත්ත සඳහන් කර ග්‍රාම නිලධාරී ඉදිරියේ අත්සන් කල ලිපිය

07.ඉඩම් අයිතිකරු මියගොස් නම් අයිතිකරුගේ කාලත්‍රයාගේ හා දරුවන්ගේ සියලුදෙනා ග්‍රාම නිලධාරි ඉදිරියේ අත්සන් කරන ලද කැමැත්ත ලිපිය.

08. ඉදිකරන නිවසට අවශ්‍ය දැව ලබා ගැනිමට නම් අනුමත නිවාස සැලැස්ම ඉදිරිපත් කල යුතුය (කොස් ගස් සඳහා)

09. ඔප්පුව බැංකුව වෙත උකස් කර ඇත්නම් බැංකුවේ කැමත්ත ප්‍රකාශිත ලිපියක් අවශ්‍ය වේ.